# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

**අති විශෙෂ**

**අංක 2474/66 - 2026 පෙබරවාරි මස 08 වැනි ඉරිදා - 2026.02.08**

**(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)**


# I වැනි කොටස: (I) වැනි ඡෙදය - සාමාන්‍ය

## රජයේ නිවේදන

**2008 අංක 14 දරන ක්‍රමෝපාය සංවර්ධන ව්‍යාපෘති පනත**

2008 අංක 14 දරන ක්‍රමෝපාය සංවර්ධන ව්‍යාපෘති පනතේ 4ඊ වැනි වගන්තිය සමඟ කියවිය යුතු 3 වැනි වගන්තිය යටතේ මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර, මුදල්, ක්‍රමසම්පාදන සහ ආර්ථික සංවර්ධන අමාත්‍ය, අනුර කුමාර දිසානායක වන මා විසින් මෙම නියෝගය මඟින් පහත උපලේඛනයේ දක්වා ඇති සුදුසුකම් නිර්ණායක සහ බදු නිදහස් කිරීම් හෝ බදු දිරි ගැන්වීම් නියම කරනු ලැබේ.

**අනුර කුමාර දිසානායක,**
මුදල්, ක්‍රමසම්පාදන සහ ආර්ථික සංවර්ධන අමාත්‍ය.

2026 පෙබරවාරි මස 08 වැනි දින,
කොළඹ 01,
මුදල්, ක්‍රමසම්පාදන සහ ආර්ථික සංවර්ධන අමාත්‍යාංශයේ දී ය.

උපලේඛනය

**වගුව : ක්‍රමෝපාය සංවර්ධන ව්‍යාපෘතියක් ලෙස හඳුනා ගැනීම සඳහා වන නිර්ණායක සහ අදාළ බදු නිදහස් කිරීම්**

| *කාණ්ඩය*<br>*(I)* | *අංශය*<br>*(II)* | *ආයෝජනය - ඇ.ඩො. මිලියන*<br>*(III)* | *අවම දේශීය රැකියා උත්පාදනය*<br>*(IV)* | *බදු විරාම වසර ගණන (සංස්ථාපිත ආදායම් බදු සඳහා)*<br>*(V)* | ***CID/VAT/PAL/CESS* බදු නිදහස් කිරීම්**<br>*(VI)* |
|---|---|---|---|---|---|
| A | යටිතල පහසුකම්<br>සේවා සහ උපයෝගිතා<br>කැසිනෝ සහ ඕනෑම ආකාරයක ඔට්ටු ඇල්ලීම සහ සූදු ක්‍රීඩා හැර, සංචාරක හා විවේක | 50 ට වැඩි නමුත් 150 නොඉක්මවන | 100 | 6 | ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීමේ කාල සීමාව තුළ ප්‍රාග්ධන භාණ්ඩ හා ඉදිකිරීම් ද්‍රව්‍ය ආනයනය කිරීම සඳහා. |
| | | 150 ට වැඩි නමුත් 300 නොඉක්මවන | 100 | 8 | |
| | | 300 ට වැඩි | 100 | 10 | |




*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය* www.documents.gov.lk *වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

| කාණ්ඩය (I) | අංශය (II) | ආයෝජනය - ඇ.ඩො. මිලියන (III) | අවම දේශීය රැකියා උත්පාදනය (IV) | බදු විරාම වසර ගණන (සංස්ථාපිත ආදායම් බදු සඳහා) (V) | CID/VAT/PAL/CESS බදු නිදහස් කිරීම් (VI) |
|---|---|---|---|---|---|
| B | නිෂ්පාදන | 50 ට වැඩි නමුත් 100 නොඉක්මවන | 250 | 5 | ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීමේ කාල සීමාව තුළ ප්‍රාග්ධන භාණ්ඩ හා ඉදිකිරීම් ද්‍රව්‍ය ආනයනය කිරීම සඳහා. |
| | | 100 ට වැඩි නමුත් 150 නොඉක්මවන | 250 | 8 | |
| | | 150 ට වැඩි | 250 | 10 | |
| C | කෘෂිකර්මාන්ත<br><br>අධ්‍යාපන, තාක්ෂණ ආයතන,<br>තොරතුරු සන්නිවේදන තාක්ෂණ | 50 ට වැඩි නමුත් 100 නොඉක්මවන | 50 | 5 | |
| | | 100 ට වැඩි නමුත් 150 නොඉක්මවන | 50 | 8 | |
| | | 150 ට වැඩි | 50 | 10 | |

මෙම නියෝග තුළ;

1. ඉහත වගුවේ (V) වන තීරුවේ දක්වා ඇති කාල සීමාව සඳහා ක්‍රමෝපාය සංවර්ධන ව්‍යාපෘතියක සියලුම ලැබීම් සහ ලාභ 2017 අංක 24 දරන දේශීය ආදායම් පනත යටතේ සංස්ථාපිත ආදායම් බද්දෙන් නිදහස් වන අතර මෙම බදු විරාම කාල සීමාව වාණිජ මෙහෙයුම් ආරම්භ කළ දින සිට ආරම්භ වේ;

2. CID - (235 වන අධිකාරය වූ) රේගු ආඥාපනත යටතේ පනවනු ලබන රේගු ආනයන බද්ද
   VAT- 2002 අංක 14 දරන එකතු කළ අගය මත බදු පනත යටතේ පනවනු ලබන එකතු කළ අගය මත බද්ද
   PAL-2011 අංක 18 දරන වරාය සහ ගුවන්තොටුපළ සංවර්ධන බදු පනත යටතේ පනවනු ලබන වරාය සහ ගුවන් තොටුපළ සංවර්ධන බද්ද
   CESS-1979 අංක 40 දරන ශ්‍රී ලංකා අපනයන සංවර්ධන පනත යටතේ පනවනු ලබන වෙළෙඳ භාණ්ඩ අපනයන සහනාධාර ක්‍රමය යටතේ වන බද්ද

3. ගමනාගමනය සඳහා භාවිතා කරනු ලබන රථ වාහන ආනයනය සඳහා ඉහත වගුවේ (VI) වන තීරුවේ දක්වා ඇති කිසිදු බදු නිදහස් කිරීමක් නොලැබේ.

4. බදු නිදහස් කාල සීමාව අවසන් වීමෙන් පසුව, පවත්නා බදු නීතිය යටතේ අදාළ බදු ගෙවීමට ව්‍යාපෘතිය බැඳී සිටී.

5. ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමේ කාල සීමාව යනු, ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලය සහ අදාළ ව්‍යවසාය අතර ඇති කරගත් ගිවිසුමේ සඳහන් දින සිට ආරම්භ වී, ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලය විසින් සහතික කරනු ලබන පරිදි වාණිජ මෙහෙයුම් කටයුතු ආරම්භ කරනු ලබන දිනෙන් අවසන් වන කාල සීමාවයි.

EOG 02 - 0082

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.